දුරකථන අංකය / Telephone: 2698471, 2698475, 2698490, 2698507

විද්‍යුත් තැපැල් / Fax: postmaster@health.gov.lk, www.health.gov.lk

මගේ අංකය / My No.: FEG/ 01/ 2008

ඔබේ අංකය / Your NO

දිනය / Date: 2008/ 04 /04

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය ආරක්ෂණ සහ පෝෂණ අමාත්‍යාංශය
# சுகாதார பராமரிப்பு போசணை அமைச்சர்
# Ministry of Healthcare and Nutrition

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරුන්,** (සෞඛ්‍ය සේවා ...).
**සියළුම පළාත් සභා අධ්‍යක්ෂකවරුන්**

## <u>2008 ඇස්තමේන්තුව යටතේ ඇති විශේෂ ප්‍රාග්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.</u>

2008 වර්ෂයේ සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රාග්ධන ඇස්තමේන්තුව යටතේ පහත සඳහන් විශේෂ ව්‍යාපෘති හඳුනාගෙන ඇත. සමහර ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී පළාත් සභා වලට අයත් ආයතන සඳහාද මුදල් ලබා දිය යුතු වේ.

එහෙයින් පළාත් සභා වලින් මුදල් ඉල්ලීමේදී පහත සඳහන් පරිදි කටයුතු කළ යුතුවේ.

(1) පළාත් සභාව මගින් කරනු ලබන ඉල්ලීමක් නමත් අදාල පළාත් සභාවේ පළාත් අධ්‍යක්ෂක විසින් ඉල්ලුම් කළ යුතුය.

(2) ඉල්ලීම පළාත් සභාවක් නොව සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ඇති ආයතනයක් නම්, ඉල්ලීම සමග පොදු 35 වවුචරයක් සකස් කර අදාල අංශයේ අධ්‍යක්ෂක විසින් ඉල්ලීම කළ යුතුය. එම අංශ වලට ද උපදෙස් අංක 6 සිට අදාල වේ. වවුචරය සමග ඉල්ලීමට අදාල තොරතුරු අමුණා තිබිය යුතුය.

(3) එම ඉල්ලීම සමග පොදු 35 වවුචරයක් සකස් කර පළාත් අධ්‍යක්ෂක විසින් අනුමත කළ යුතුය.

(4) වවුචරය සමග පහත සඳහන් ලියවිලි අමුණා තිබිය යුතුය.
- අ.) අදාල කාර්ය කිරීම සඳහා පළාත් සභාවේ අනුමැතිය.
- ආ.) අදාල කාර්ය සඳහා අනුමත කරන ලද ඇස්තමේන්තුව.
- ඇ.) ඉල්ලීම තහවුරු කරන නවත් තොරතුරු ඇත්නම්.
  ඡායා පිටපත් නම් සහතික කරන ලද ඡායා පිටපත් විය යුතුය.

(5) ඉල්ලීම සෞඛ්‍ය අමාත්‍යාංශයේ පහත සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ට අදාල වන කාර්යයන් විය යුතුවේ.

(6) සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාල අංශය මගින් ලේඛණ වල සටහන් කොට අදාල නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්වරයා ගේ නිර්දේශයන් සහිතව අනුමැතිය සඳහා අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) වෙත ඉදිරිපත් කළ යුතුය.

(7) අනුමැතිය ලැබුණු පසු අදාල අංශය මගින් එහි ඡායා පිටපතක් තබාගෙන ගෙවීම් සඳහා මුදල් අංශය වෙත යොමු කළ යුතුය.

(8) මුදල් අංශය විසින් චෙක්පත ලියූ වහාම අදාල අංශය විසින් චෙක්පත ලබා ගෙන පලාත් සභාවට යැවිය යුතුය.

| කාර්ය විස්තරය | වගකිවයුතු නිලධාරී | අනුමැතිය | මුදල (රු.මිලි.) |
|---|---|---|---|
| • වතු රෝහල් සංවර්ධනය | අධ්‍යක්ෂක (වතු රෝහල්) | අති.ලේකම් (වෛද්‍ය සේවා) | 224.4 |
| • අර්බුද සම්බන්ධ හදිසි අවස්ථා | | | |
| • විධිවිධාන කළමනාකරණය | | | |
| ගොඩනැගිලි ඉදිකිරීම් හා අලුත්වැඩියා | නි. අධ්‍ය. ජනරාල් ( සැපයීම්) | එම | |
| වෛද්‍ය උපකරණ | නි.අධ්‍ය.ජනරාල් ( ජීව වෛද්‍ය උපකරණ ) | එම | 145.0 |
| දන්ත වෛද්‍ය උපකරණ | නි.අධ්‍ය.ජනරාල් ( දන්ත වෛද්‍ය ) | එම | |
| කාර්යාල උපකරණ | නි.අධ්‍ය.ජනරාල් ( මුදල් II ) | එම | |
| • ජලභීතිකා පාලන වැඩසටහන | නි.අධ්‍ය.ජනරාල් ( මහජන සෞඛ්‍ය I ) /අධ්‍යක්ෂක ( ජලභීතිකා පාලන ) | එම | 93.0 |
| • තැලසීමියා රෝගය සඳහා උපකරණ | නි.අධ්‍ය.ජනරාල් ( මහජන සෞඛ්‍ය I ) | එම | 45.0 |

(9) ලබා ගන්නා ලද මුදල් පිළිබඳ ප්‍රගතිය මාසිකව හෝ අවම වශයෙන් මාස තුනකට වරක් ඉහත වගකිව යුතු නිලධාරී වෙත වාර්තා කළ යුතුය. ( මූල්‍ය හා භෞතික ප්‍රගතිය )

(10) මෙම අමාත්‍යාංශය විසින් දෙනු ලබන්නේ අත්තිකාරම් මුදලක් හෙයින්, ලබා ගන්නා මුදල් පියවීම 2008 නොවැම්බර් මස 30 දිනට හෝ ඊට පෙර කළ යුතුය.

(11) ලබා ගත් අත්තිකාරම් මුදල් වවුචර් පත් මගින් හෝ චෙක් පත් මගින් කළ හැක. චෙක් පත් මගින් පියවන විට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් නමින් චෙක් පත ලිවිය යුතුය.

(12) අත්තිකාරම් පියවීමේදී ද ඉහත මාර්ගයෙන්ම මුදල් අංශයට පියවීමේ වවුචර් ඉදිරිපත් කළ යුතුය.

(13) පියවීමේ වවුචර් ඉදිරිපත් කිරීමේ දී පහත සඳහන් ලියකියවිලි වල ඡායා පිටපත් ඉදිරිපත් කළ යුතුය.

අ) ඉදිකිරීම් කටයුත්තක් නම්, ඉංජිනේරු අංශයේ සහතිකය, උපදේශාත්මක ආයතනයේ ගෙවීම් සහතිකය.

ආ) මිලදී ගැනීමක් නම්, ටෙන්ඩර් කාර්ය පටිපාටිය අනුගමනය කර ඇති බවට ලේඛන, ගබඩා ලේඛන සහතික.

ඇ) ආහාර හෝ වෙනත් ද්‍රව්‍ය බෙදා හැරීමක් නම්, ඒ සඳහා ටෙන්ඩර් මණ්ඩලයේ තීරණ, බෙදා හරින ලද ද්‍රව්‍ය පිළිබඳ ලේඛනයක්, බෙදා හරින ලද අයගේ නාම ලේඛනයක්.

වෛද්‍ය නිහාල් ජයතිලක,
අතිරේක ලේකම්.
( වෛද්‍ය සේවා )

පිටපත් :-
නියෝජ්‍ය අධ්‍යක්ෂක ජනරාල්වරුන්.